// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1855/39 – 2014 මාර්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2014.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් සභාවේ 2003 අංක 03 දරන "ඌව පළාත් ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය" සංශෝධනය කිරීම සඳහා වන සංශෝධිත ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් සංශෝධිත ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මවා ගිය පසු, මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු ලිඛිතව මා වෙත දැනුම් දිය යුතු ය.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2014 මාර්තු මස 25 වැනි දින,
බදුල්ල, රජවීදියේ,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**ඌව පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාත් "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන ඌව පළාත් සභාවේ 2014 අංක ....... දරන ඌව පළාත් "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තියයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තියේ ඌව පළාත් සභාවේ "2014 අංක ...... දරන ඌව පළාත් ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය)

02. මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ප්‍රධාන ප්‍රඥප්තියේ 03(2) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඌව පළාත් ආණ්ඩුකාරවරයා
(ආ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා
(ඇ) ඌව පළාත් සභාවේ සභාපතිවරයා
(ඈ) ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රතිපක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
(ඉ) ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා
(ඊ) ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්වරයා
(උ) "ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන්නා වූ ද, ආණ්ඩුකාරවරයා විසින් එක් එක් තැනැත්තන් වෙත නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තන් විසින් (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු වුවද, වෙනත් සාමාජිකයන් තිදෙනෙක් යන අයගෙන් සමන්විත යුතු අතර ඉන් දෙදෙනෙකු ගණකාධිකාරී හා නීතිඥ වෘත්තියේ නියුතු අය විය යුතු ය."

යන උප වගන්තිය වෙනුවට

මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ඌව පළාත් ආණ්ඩුකාරවරයා,
(ආ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,
(ඇ) ඌව පළාත් සභාවේ සභාපතිවරයා,
(ඈ) ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රතිපක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.
(ඉ) ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා,
(ඊ) ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්වරයා,
(උ) ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,
(ඌ) ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,
(එ) ඊට අමතරව, ගණකාධිකාරිවරයෙකු හා නීතිඥ වෘත්තියේ නියුතු අයෙකු ඇතුළු සාමාජිකයින් තිදෙනෙකු ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අභිමතය පරිදි පත් කළ යුතු ය. ආණ්ඩුකාරවරයා විසින් එක් එක් තැනැත්තන් වෙත නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තන් විසින් (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු ය.''

වශයෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

03. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපවත්වන්නේ ය.

04-347

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.